PR/2020/S 11

# ජපන් තානාපති කාර්යාලය

නො.20 ශ්‍රීමත් ආර්.පී.සේනානායක මාවත, කොළඹ 07

දුරකථනය: 94-11-269-3831~3, ෆැක්ස්: 94-11-269-8629

ඊ-මේල්: cultujpn@co.mofa.go.jp

ජූලි 13, 2020

## පුවත්පත් නිවේදනය

**මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ශිෂ්‍යත්ව ව්‍යාපාතියට ජපානයෙන් රුපියල් මිලියන 457 ක ආධාර ප්‍රදානයක්.**

ජපන් රජය මගින් රාජ්‍ය අංශයේ නිලධාරින්ගේ ධාරිතා සංවර්ධනය කිරිම සඳහා රුපියල් මිලියන 457 ක ආධාර ප්‍රදානයක් මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව ව්‍යාපාතිය සඳහා ලබා දී ඇත.

ජපන් යෙන් මිලියන 269 ක් (දළ වශයෙන් රුපියල් මිලියන 457 ක්) වන මෙම ප්‍රදානය, රාජ්‍ය සේවයේ නියුතු විධායක ශ්‍රේණියේ තරුණ නිලධාරින් අනාගතයේ අදාල ක්ෂේත්‍රයන්හි නායකත්වය දැරීමට සුදුසු වන පරිදි ඔවුන්ගේ පරිපාලන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ජපන් විශ්ව විද්‍යාලයන්හී අධ්‍යාපනය ලබා දීමට භාවිතා කෙරේ. මෙම ප්‍රදානය ඔස්සේ රාජ්‍ය නිලධාරින් 17ත් දෙනෙකුට, දෑ අවුරුදු පශ්චාත් උපාධි පාඨමාලා හෝ ආචාර්ය උපාධි හැදෑරීමට 2021 වසරේ සිට 2023 වසර දක්වා අවස්ථාව සලසා දී ඇත. රාජ්‍ය ප්‍රතිපත්තිය, රාජ්‍ය මූල්‍ය, ආර්ථික විද්‍යාව, ව්‍යාපාර කළමනාකරණය, පරිසර කළමනාකරණය, ආපදා කළමනාකරණය සහ දේශගුණික විපර්යාස අධ්‍යයන යනාදී ක්ෂේත්‍ර මෙම පශ්චාත් උපාධි පාඨමාලා මගින් ආවරණය වේ.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම සඳහා දෙරට අතර හුවමාරු පත්‍ර අත්සන් කිරීම 2020 ජූලි 13 වෙනි දින මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේදී ශ්‍රී ලංකාවේ ජපන් තානාපති සුගියම අකිරා මහතා සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර් ආටිගල මහතා විසින් සිදුකරනු ලැබිය.

ජපානය දීර්ඝකාලීන මිතුරෙකු ලෙස, ලංකාවේ වේගවත් තිරසර ආර්ථික සංවර්ධනයක් ළඟාකර ගැනීමේ අරමුණ උදෙසා මානව සම්පත් සංවර්ධනය කිරීම වෙනුවෙන් ධාරිතා ගොඩනැංවීමේ සහ නිපුණතා සංවර්ධනය කිරිමේ වැඩසටහන් රාශියක් මේ වන විට දියත් කර තිබේ.

මෙම වැඩසටහන ආරම්භ වූ 2010 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය අංශයේ නිලධාරින් 154 දෙනෙක් උදෙසා මෙමගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කර ඇත. මෙම ව්‍යාපාතිය තුලින් තනි පුද්ගල ධාරිතා සංවර්ධනය පමණක් නොව ශ්‍රී ලංකාවේ සමෘද්ධිමත් භාවයට හා අනාගත දියුණුවට පදනම වන රාජ්‍ය අංශයේ ආයතන වල ආයතනික ධාරිතාවයද ඉහල නැංවේ.(නිමි)

*************************************************************

වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න.

සංවර්ධන සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථනය 011-2693831-3 (දිගු අංකය 226)